# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2249/51 – 2021 ඔක්තෝබර් 16 වැනි සෙනසුරාදා – 2021.10.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, J/359 ඉමායනන් බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉමායනන් ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක Ya/KRV/2019/282 හා 2019.12.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර **'A'** – වෙක්කාල් සහ වෙක්කාල්මෙට්කු – **ප්‍රමාණය: හෙක්. 0.0541**

උතුරට: පාර (මා.සං.අ.); නැගෙනහිරට: සෙලර් සන්මුගරත්නම් හිමිකම් කියන නම නොදන්නා ඉඩම; දකුණට: සෙලර් සන්මුගරත්නම් හිමිකම් කියන නම නොදන්නා ඉඩම සහ වසීකරන් සෝබනා සහ වෙනත් අය හිමිකම් කියන නම නොදන්නා ඉඩම; බටහිරට: වසීකරන් සෝබනා සහ වෙනත් අය හිමිකම් කියන නම නොදන්නා ඉඩම සහ පාර.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2019/WS/216.
2021 ජුනි මස 16 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 – 507



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*